ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2015/05/29 |

## 2015 මැයි මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/07=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත අප්‍රේල් මාසයේ වාර්තා කළ සියයට 0.1 හි සිට මැයි මාසයේ දී සියයට 0.2 දක්වා ආන්තික වශයෙන් ඉහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2015 අප්‍රේල් මස පැවැති සියයට 2.1 හි සිට 2015 මැයි මාසයේ දී සියයට 1.9 දක්වා පහළ වැටිණි.



ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොට ගෙන කො.පා.මි.දර්ශකය 2015 අප්‍රේල් මාසයේ සිට මැයි මාසය දක්වා සියයට 0.7 කින් ඉහළ ගියේය. බොහෝ එළවළු වර්ග, මත්ස්‍ය හා කරවල වර්ග, ලොකු ළූනු, දෙහි සහ පොල් ආදියෙහි මිල ගණන් 2015 අප්‍රේල් මස පැවති මිල ගණන් සමග සසඳන විට ඉහළ ගියේය. කෙසේ වුවද, සහල්, සීනි, උම්බලකඩ සහ සමහර පළතුරු වර්ගවල මිල පහළ යෑම් මෙම මාසය තුළ වාර්තා විය.

ආහාර නොවන කාණ්ඩයේ විවිධ භාණ්ඩ හා සේවා; සහ විනෝදාත්මක හා සංස්කෘතික උප කාණ්ඩවල මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගිය අතර රෙදිපිළි හා පාවහන්; නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු; සෞඛ්‍ය; ප්‍රවාහන; අධ්‍යාපන සහ සන්නිවේදන යන උප කාණ්ඩවල මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන මූලික උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත 2015 අප්‍රේල් මස පැවති සියයට 2.4 හි සිට 2015 මැයි මාසයේ දී සියයට 2.6 දක්වා ආන්තික වශයෙන් ඉහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2015 අප්‍රේල් මාසය සමග සසඳන විට 2015 මැයි මාසයේ දී සියයට 2.9 හි නොවෙනස්ව පැවතිණි.